රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 30/96

මගේ අංකය :- IV/2/3/9(එච්)පොදු 51
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.10.14

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත

**බඳවාගැනීමේ පරිපාටිවලින් බැහැරව රජයේ සේවයට බඳවාගත්**
**<u>නිලධාරීන්ට වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දිගු ලබා දීම</u>**

අනියම් හා තාවකාලික වශයෙන් රජයේ සේවයට බඳවාගනු ලැබූ හා විශේෂ කාර්යභාරය ඉටු කරවා ගැනීම සඳහා ඇතැම් අවස්ථාවලදී බඳවා ගන්නා ලද නිලධරින් විශේෂ අමාත්‍ය මණ්ඩල තීරණ මගින් හා පරිපාලනමය තීරණ මත විවිධ අවස්ථාවලදී ස්ථිර සේවයට පත් කරනු ලැබූ බැව් දක්නට ලැබී තිබේ.

02. ඉහත දක්වූ පදනම යටතේ විශේෂ අනුමතින් පිට එසේ සේවයේ ස්ථිර කරනු ලැබූ හා එම සේවාවලට බඳවාගන්නා අවස්ථාවේදී ක්‍රියාත්මකව තිබූ බඳවාගැනීමේ පරිපාටිවලට අනුව අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් නොමැති නිලධාරීන් ඔවුන් වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයස වන අවුරුදු 55 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම සඳහා හිමිකම් නොලැබිය යුතුය.

03. එසේ වුවද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබීමට අවශ්‍ය දස වසරක සේවා කාලයක් සම්පූර්න කිරීම සඳහා පමණක් ඉහත ගණයට ගැනෙන නිලධාරියෙකුට ඒ සඳහා අවම සේවා දීර්ඝයක් අදළ බලධාරියාගේ අනුමතිය මත ලබා දිය හැක.

04. ඔබ යටතට ගැනෙන අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල සේවයේ යෙදී සිටින ඉහත වර්ගයට අයත් නිලධාරින්/ සේවකයන් සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර ඇතුළත් ලේඛනයක් ඒ ඒ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු කාර්යාලවල යාවත්කාලීනව පවත්වා ගෙන යමින් ඔවුන් විශ්‍රාම ගැනීමේ වෛකල්පිත වයසට එළඹෙන්ම මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.